පොදු චක්‍රලේඛ අංක : 01-65 /2016

මගේ අංකය :- HP/DP/29/2016

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
අංක 385, "සුවසිරිපාය"
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

2016.11.12.

සියලුම නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්

සියලුම පළාත්/ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සියලුම විශේෂිත සෞඛ්‍ය ව්‍යාපාර / වැඩසටහන් ප්‍රධානීන්

සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන් / වෛද්‍ය අධිකාරිවරුන්

සියලුම ආයතන ප්‍රධානීන්

**<u>කොළඹ දන්තායතනය ශ්‍රී ලංකා ජාතික දන්ත වෛද්‍ය රෝහල (ශික්ෂණ) ලෙස නැවත නම් කිරිම</u>**

කොළඹ දන්තායතනය එවකට පැවති කොළඹ මහ රෝහලට අනුබද්ධව 1926 වසරේදී පිහිටුවන ලදි. එම වකවානුවේදී පැවති ප්‍රතිකාර සේවා සහ ඉල්ලුම අනුව මෙම ආයතනය දන්තායතනය ලෙස නම් කරන ලද අතර එහි ප්‍රතිකාර සේවාවන් සීමිත පරාසයකට අයත් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන්ගෙන් සමන්විත විය. මේ අතර මෙම ආයතනයේ සේවාවන් ක්‍රම ක්‍රමයෙන් දන්ත වෛද්‍ය ක්ෂේත්‍රයේ දියුණුව හා ගෝලීය අත්දැකීම්ද සමඟ පුළුල් විය.

දන්තායතනයෙහි වර්තමාන සේවාවන්ගේ විෂය පථය පසුගිය දශක කීපය තුලදී ප්‍රාථමික ප්‍රතිකාර සේවාවන්හි සිට නවීන තාක්ෂණයෙන් සමන්විත තෘතියික සේවාවන් වන මුඛ හනුක හා වක්ත්‍ර ශල්‍ය ප්‍රතිකාර, නවීන විකල දන්ත ප්‍රතිකාර, දන්ත සහ හකු ආශ්‍රිත ප්‍රතිකාර, නවීන සංරක්ෂණ හා කෘත්‍රිම දන්ත ප්‍රතිකාර සේවාවන් දක්වා පුළුල් විය. තවද මෙම ප්‍රතිකාර සේවා පවත්වාගෙන යාම සඳහා විකිරණ හා රසායනාගාර සේවාවලින් පහසුකම් සැපයේ. මෙයට සමගාමීව දන්ත වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් පශ්චාත් උපාධිලාභීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙසද දන්තායතනය කටයුතු කරනු ලැබේ.

ඉහත විෂය පථයට අනුකූලව දන්තායතනය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රෝහල වන ශ්‍රී ලංකා ජාතික රෝහල සමඟ අනුපූරක කාර්යභාරයක්ද ඉටුකරනු ලබයි. තවද දන්තායතනය පශ්චාත් උපාධි අධ්‍යයන සහ දන්ත වෛද්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු වලට අදාලව ජාත්‍යන්තර ආයතන සමඟද සහයෝගීත්වයෙන් කටයුතු කරනු ලැබේ.

යථෝක්ත සංවර්ධිත තත්වයන්ට අනුකූල වන පරිදි වහාම ක්‍රියාත්මක වන පරිදි දන්තායතනය **ශ්‍රී ලංකා ජාතික දන්ත වෛද්‍ය රෝහල (ශික්ෂණ)** යනුවෙන් නැවත නම්කරනු ලැබේ.

මෙම ආයතනයට අදාල තොරතුරු පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| ආයතනයේ නම | :- | **ශ්‍රී ලංකා ජාතික දන්ත වෛද්‍ය රෝහල (ශික්ෂණ)** |
| පරිපාලන දිස්ත්‍රික්කය | :- | කොළඹ |
| ඡන්ද කොට්ඨාශය | :- | බොරැල්ල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | :- | තිඹිරිගස්යාය |
| ආසන්නතම පරිපාලන කාර්යාලය | :- | ශ්‍රී ලංකා ජාතික රෝහල |
| ආයතන ප්‍රධානී | :- | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් |
| තැපැල් හා විදුලි පණිවුඩ කාර්යාලය | :- | මරදාන |
| ආසන්නතම දුම්රියපල | :- | මරදාන |
| පොලිස් ස්ථානය | :- | මරදාන |

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය පී.ජී. මහීපාල
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**